# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2313/67 – 2023 ජනවාරි මස 07 වැනි සෙනසුරාදා – 2023.01.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 663, වටරක ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වටරක ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක KU/MWT/2019/451 හා 2020.05.26 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබල්ලට මායිම්:

01. කැබලි අක්ෂර **‘A’ – වටරක දේවාලහුමිය – ප්‍රමාණය: හෙක්. 0.0472 ක් පමණ**

උතුරට: මාර්ගය; නැගෙනහිරට: මාර්ගය සහ පළාත් මාර්ග සංවර්ධන අධිකාරි මාර්ගය; දකුණට: පළාත් මාර්ග සංවර්ධන අධිකාරි මාර්ගය සහ කුස්තන් ආරච්චිගේ චමින්ද හිමිකම් කියන මල්වත්තහේන්යාය; බටහිරට: කුස්තන් ආරච්චිගේ චමින්ද හිමිකම් කියන මල්වත්තහේන්යාය සහ මාර්ගය

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2018/S/11.
2022 නොවැම්බර් මස 11 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 01 – 0043

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කොටපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරවක් කෝරළේ සුළු කොට්ඨාසයේ මතුගොබේ (අ. ග. පි. 169) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක MA/KTP/2020/496 හා 2020.11.17 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබලිවලට මායිම්:

**2. පරවශතාවේ විස්තරය** - දෙනියාය ජල සම්පාදන ක්‍රමය යටතේ අමු ජලය ප්‍රවාහනය කරන නල එලීම සඳහා ඉඩම් කොටසක පරවශතාව අත්කර ගැනීමට.

01. **කැබලි අක්ෂර 'A' – දෙමලිය දොලවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0469**

උතුරට: මාර්ගය (ප්‍රාදේශීය සභාව) හරිලාල් ජයන්ත රණ්ඹෙගොඩ විජේසේකර සහ අබේසිංහ සොබාවික්‍රම මල්ලිකා විදානආරච්චිගේ හිමිකම් කියන දෙමලිය දොලවත්ත; නැගෙනහිරට: හරිලාල් ජයන්ත රණ්ඹෙගොඩ විජේසේකර සහ අබේසිංහ සොබාවික්‍රම මල්ලිකා විදානආරච්චිගේ හිමිකම් කියන දෙමලිය දොලවත්ත කැබලි අක්ෂර B; දකුණට: කැබලි අක්ෂර B සහ මාර්ගය; බටහිරට: මාර්ගය සහ හරිලාල් ජයන්ත රණ්ඹෙගොඩ විජේසේකර හිමිකම් කියන දෙමලිය දොලවත්ත .

02. **කැබලි අක්ෂර 'B' – දෙමලිය දොලවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0006**

උතුරට: කැබලි අක්ෂර A සහ අබේසිංහ සොබාවික්‍රම මල්ලිකා විදානආරච්චිගේ හිමිකම් කියන දෙමලිය දොලවත්ත; නැගෙනහිරට:අබේසිංහ සොබාවික්‍රම මල්ලිකා විදානආරච්චිගේ සහ හරිලාල් ජයන්ත රණ්ඹෙගොඩ විජේසේකර හිමිකම් කියන දෙමලිය දොලවත්ත; දකුණට: හරිලාල් ජයන්ත රණ්ඹෙගොඩ විජේසේකර හිමිකම් කියන දෙමලිය දොලවත්ත සහ මාර්ගය; බටහිරට: මාර්ගය සහ කැබලි අක්ෂර A.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/18/2020/WS/179.
2022 නොවැම්බර් මස 30 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 01 – 0044

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.